**ශීර්ෂය 301 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 301 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 29 දින සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

(අ) මුළු ප්‍රතිපාදන හා වියදම

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 86.99 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 79.62 ක් උපයොජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 7.37 ක් හෙවත් සියයට 8.47 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 63.79 | 62.20 | 1.58 | **2.48** |
| මූලධන | 23.20 | 17.42 | 5.79 | **24.95** |
| එකතුව | 86.99 | 79.62 | 7.37 | **8.47** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 5.54 | 3.31 | 2.54 | 3.53 | 20.00 | 11.60 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ අංක 7002/0000/00/0108/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.37,304 ක් වී තිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ අංක 6000/0000/00/0017/0032/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 13.68 ක් වී තිබුණි.

**2.5 විගණන නිරීක්ෂණය**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පිළියෙල කර නොතිබුණි.

## 3.2 පොදු තැන්පත් ගිණුම

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සමිතිවල අවශ්‍යතා මත අභියාචනා ගාස්තු, උසාවි දඩ මුදල්, තීරක ගාස්තු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. 2010 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 13.68 ක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

විෂයය අංක 30101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,095,823 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 සැප්තැම්බර් 30 දින වන විට 1997,2001 සහ 2011 වර්ෂවල විශ්‍රාම ගිය නිලධාරින් 03 දෙනෙකුගෙන් අයවීමට තිබුණු ණය ශේෂ රු. 662,018 ක් වූ අතර වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවීමට ඇති ණය ශේෂ රු.224,815 ක් විය. මෙම ණය ශේෂය වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා පැරණි ශේෂයන් විය.

## 3.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 3.4.1 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත වාර්තා කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 අගෝස්තු 26 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

## 3.5 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

ලියාපදිංචි සමුපකාර සමිති 59 කින් සමිති 26 ක පමණ 2015 වර්ෂයේදී විගණන කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) **සැලැසුම් කිරීම**

-----------------

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව සමිතිවල ගිණුම් 80 ක් විගණනය කර වාර්තා 75 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණු කාර්ය පැවරුම් සංඛ්‍යාව 43 ක් වූ අතර එයින් නිකුත් කර තිබූ විගණන වාර්තා සංඛ්‍යාව 16 කි. තවත් වාර්තා 13 සමාලෝචන අදියරේ පැවතුණි.

**3.6 අනාර්ථික ග නුදෙනු**

--------------------

ශ්‍රී ලංකාවේ සමූපකාර ක්ෂේත්‍රයට ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම, ජාත්‍යන්තර වශයෙන් අදහස් හා යෝජනා ලබාගෙන එක් එක් අංශ දියුණුවට පත් කිරීම, රටේ සංවර්ධනයට ඵලදායීව දායකවීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා සමූපකාර ක්ෂේත්‍රයේ විවිධ අංශ ආවරණය වන පරිදි කෘෂිකාර්මික සමූපකාරකයින්ගේ සහයෝගිතා ජාලයේ සාමාජික රටවල් නියෝජනය කරමින් 40 දෙනෙකුගෙන් යුතු විදේශීය කණ්ඩායමක් අධ්‍යාපන චාරිකාවකට සහභාගී වී තිබුණි. මේ සඳහා රු.5,362,792 ක් වැය කර තිබුණු අතර එයින් සියයට 58 වැයකර තිබුණේ ආහාර හා නවාතැන් පහසුකම් සඳහා වැය කර තිබුණි.

**3.7 කළමනාකරණ දුර්වලතා**

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් චක්‍රීය අරමුදලින් පළාත් පාරිභෝගික සංගම් 09 කට හා සමූපකාර තොග වෙළඳ සංස්ථාව වෙත රු. මිලියන 635 ක් වූ ණය මුදල් නිකුත් කර තිබුණි. එම අරමුදල් කාර්යක්ෂමව ඵලදායී ලෙස උපයෝජනය කිරීම, ප්‍රගතිය සහ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව පරීක්ෂා කර කොටස් වශයෙන් ණය ලබා දීම වෙනුවට එකවර විශාල මුදලක් පාරිභෝගික සංගම් වෙත නිදහස් කර තිබුණි.

(ආ) චක්‍රීය අරමුදලින් සමූපකාර සමිති හා අනෙකුත් ආයතන වෙත ණය ලබා දී තිබුණි. වර්ෂ 5 ක කාලය මුළුල්ලේ පැවැති ණය ආපසු අයකර ගැනීමේ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. මේ නිසා ලබා දුන් මුළු ණය මුදලින් රු.මිලියන 292.9 ක් හෙවත් මුළුණය මුදලින් සියයට 46 ක ප්‍රමාණයක් අය කර ගෙන තිබුණි.

(ඇ) චක්‍රීය අරමුදලින් සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සංගමය වෙත ලබා දී තිබූ රු.127,000,000 ක මුදලින් රු. 54,210,209 ක් වූ මුල් මුදල හා හිඟ පොළිය වූ රු.648,055 ඇතුළුව මුළු මුදල වශයෙන් රු. 54,858,265 ක මුදලක් අයවීමට පැවතුණි.

(ඈ) 2015 වර්ෂයේදී වැඩසටහන් 08 ක් සඳහා එකතුව රු. 1,102,500 ක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබූ අතර එම මුදලින් එකතුව රු. 740,421 ක් වියදම් නොකර පියවා තිබුණි. වියදම් නොකර ඉතිරි වූ අත්තිකාරම් මුදල සියයට 49 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් සමන්විත විය.

**3.8.** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 04 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 02 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 105 | 79 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 14 | 06 |
| | **එකතුව** | **141** | **99** | **42** |